# අධ්‍යාපන අමාත්‍යාංශය
# ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

## ළගම පාසල හොදම පාසල ජාතික වැඩ සටහන

## පුරප්පාඩු

පාසල් සංවර්ධනය උදෙසා වන "ළගම පාසල හොදම පාසල" ජාතික වැඩසටහනේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පවත්නා පහත සදහන් පුරප්පාඩු පිරවීම සදහා නියමිත සුදුසුකම් ලත් හා පළපුරුදු සහිත අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2016 සහ එහි සංශෝධන පරිදි අවශ්‍ය සුදුසුකම් සහ පලපුරුද්ද, | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2016 පරිදි වැටුප | ඇබෑර්තු සංඛ්‍යාව හා සේවා ස්ථානය |
|---|---|---|---|---|
| 01 | **කළමණාකරණ සහකාර** | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ එක්වර සිංහල / දෙමල/ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ඕනෑම එක් භාෂාවකට සහ ගණිතය ඇතුළුව විෂයන් හතරක් (04) සදහා සම්මාන සහිතව විෂයන් හයකින් (06) සමත් වී තිබීම.<br>සහ<br>අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ විෂයන් තුනකින් (03) (සමාන්‍ය පොදු ප්‍රශ්ණ පත්‍රය හැර) සමත් වී තිබීම. | රාජ්‍ය සේවයේ සමාන තනතුරු සදහා මූලික පියවර සමග මූලික පියවරෙන් 50% ක් | 01 (ව්‍යාපෘති කලමනාකරන ඒකකය, ඉසුරුපාය - බත්තරමුල්ල)<br><br>01 (උතුරු පළාත -කෝපායි) |
| 02 | **කායර්ාල කායර්ය සහයක** | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සම්මාන දෙකක් (02) සහිතව විෂයන් හයකින් (06) සමත් වී තිබීම. | රාජ්‍ය සේවයේ සමාන තනතුරු සදහා මූලික පියවර සමග මූලික පියවරෙන් 50% ක් | 01 (වයඹ පළාත) |

**පොදු කොන්දේසි**

01. සියළුම අයදුම්කරුවන් අයදුම්පත් බාරගැනීම අවසන්කරනු ලබන දින වන විට වයස අවුරුදු 35 ට අඩු විය යුතුයි.
02. කළමනාකරණ සහකාර තනතුර සඳහා ස්ප්‍රෙඩ් ෂීට්, වදන් සැකසුම, ඉදිරිපත් කිරීම, අන්තජර්ාලය හා ඊ මේල් සම්බන්ධ පරිගණක සාක්ෂරතාව අනිවායර්යෙන් තිබිය යුතුයි.
03. කළමනාකරණ සහකාර තනතුර සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරිමේ හැකියාව තිබිය යුතුයි.
04. සේවා කොන්තරාත්තුව මූලික වශයෙන් එක් වසරක් සඳහා වන අතර, ඉන් මාස 06 ක් පරිවාස කාලයකට යටත් වනු ඇත.කොන්ත්‍රාත් කාලය, සතුටුදායක කායර්සාධනය සහ ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත තවදුරටත් වාෂර්ිකව අළුත් කිරීමේ හැකියාව පවතී.
05. තෝරාගත් සේවකයන්හට ජීවන වියදම් දීමනාව හා සේවක අථර්සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් දායකත්වයද හිමිය.
06. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාල ආයතන ප්‍රධානී / ප්‍රධාන විධායක නිලධාරී මගින් යොමු කල යුතු අතර , ඔහු විසින් මෙම අයදුම්කරු මෙම පැවරුමට තෝරාගනු ලැබුවහොත් දැනට දරණ තනතුරින් මුදාහැරිය හැකිද යන්න සදහන්කල යුතුය.
07. කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයන්ට කැඳවනු ලැබේ.
08. තමන් විසින්ම සකස් කර ගනු ලබන ජීව දත්ත සහිත අයදුම්පතක්, අධ්‍යාපනික, වෘත්තීය, සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්ද සමග ඥාතී නොවන නිදෙර්ශකයන් දෙදෙනෙකුගේ නම්ද සහිතව ඉදිරිපත් කල යුතුයි.

අයදුම් පත බහා එවනු ලබන කවරයේ වම් ඉහල කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර . "ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, 07 වන මහල ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට 2019.04.16 දිනට පෙර ලැබීමට සැළැස්විය යුතුයි.

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
පැලවත්ත,
බත්තරමුල්ල.